**ශීර්ෂය 160 - මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

ශීර්ෂය 160 - මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජූලි 14 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත්කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචන හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

## 2.1 විසර්ජන ගිණුම

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 35,886.83 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 28,720.47 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 7,166.36 ක් හෙවත් සියයට 19.97 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ප්‍රතිශතයක් ලෙස |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 3,534.73 | 3,516.46 | 18.27 | 0.52 |
| මූලධන | 32,352.10 | 25,204.01 | 7,148.09 | 22.09 |
| **එකතුව** | **35,886.83** | **28,720.47** | **7,166.36** | **19.97** |

**2.2 අත්තිකාරම් ගිණුම**

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල විෂය අංක 16001 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 9.30 | 7.65 | 5.80 | 10.42 | 45.00 | 30.82 |

**2.3 අග්‍රිම ගිණුම**

අමාත්‍යාංශය යටතේ වූ අග්‍රිම ගිණුම් 02 කට අදාළව 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 307.57 ක් විය. විස්තර පහත දැක්වේ.

| අග්‍රිම ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 7002/0000/00/0323/0015/000 | 234.05 |
| 7003/0000/00/0091/0015/000 | 73.52 |
| **එකතුව** | **307.57** |

**2.4 පොදු තැන්පත් ගිණුම**

අමාත්‍යාංශය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 04 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 60.37 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0015/0070/000 | 6.51 |
| 6000/0000/00/0013/0074/000 | 0.65 |
| 6000/0000/00/0018/0061/000 | 52.98 |
| 6000/0000/00/0016/0061/000 | 0.23 |
| **එකතුව** | **60.37** |

**2.5 විගණන නිරීක්ෂණය**

-----------------------

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

-----------------------------------------------

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

-------------------------------------------

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීන කර පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|
| පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. | පවත්වා නොතිබුණි. |
| ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | පවත්වා නොතිබුණි. |
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |

**3.2 විගණන විමසුම්වලට පිළිතුරු දීම**

-----------------------------------

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 08 කට 2015 මැයි 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.5,615,629 ක් විය.

**3.3 විසර්ජන ගිණුම**

-----------------

**අයවැය විචලනය**

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 08ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 1,059.95 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) වැය විෂයයන් 40 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ක සිට සියයට 89 ක් දක්වා අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ඇ) වැය විෂයයන් 05ක් සඳහා මුදල් රෙගුලාසි 66 හා පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් ලබා ගෙන තිබුණු එකතුව රු.මිලියන 18.62 ක ප්‍රතිපාදන උපයෝජනය නොකර මුළුමනින්ම ඉතිරි කර තිබුණි.

**3.4 පොදු තැන්පත් ගිණුම**

**----------------------**

වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.මිලියන 6.66 ක්වූ තැන්පතු 21 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.5 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**-------------------------------------**

**වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

**--------------------------------**

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කර භාණ්ඩ හා සේවා ලබා ගැනීමට වාර්ෂික අය වැය ඇස්තමේන්තුව අනුව රු.මිලියන 307.7 ක ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් අනුමත කර තිබුණි. සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරීම සඳහා 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්මක් විස්තරාත්මකව සකස් කර නොතිබුණි.

**3.6 වත්කම් කළමනාකරණය**

**--------------------------**

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

**--------------------------------------**

අමාත්‍යාංශය සතු මෝටර් වාහන 04 ක් වර්ෂ 02 ක කාලයක සිට නිෂ්ක්‍රීයව පැවති බව නිරීක්ෂණය විය.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

**-------------------------------------**

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2016 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ඉදිරිපත් කරන ලද වාර්තා තුළ අමාත්‍යාංශය සතු වාහන පිළිබඳ භෞතික සත්‍යාපනයක් සිදුකර නොතිබුණි.

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

**-------------------------**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අමාත්‍යාංශය විසින් 2015 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 කට අඩු කාලයක සිට පැවැත එමින් තිබුණු බේරුම් නොකළ බැරකම්වල වටිනාකම රු.මිලියන 8.53 ක් විය.

(ii) 2015 වර්ෂයට අදාළ එකතුව රු. මිලියන 6.35 ක බැරකම්, බැරකම් ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි.

(iii) 2016 වර්ෂයට අදාල රු.284,491 ක් 2015 වර්ෂයේ බැරකම් ලෙස හඳුනාගෙන තිබුණි.

(iv) 2015 වර්ෂයට අදාළව වැය විෂයයන් 13 කට සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදන ඉක්මවා එකතුව රු.මිලියන 5.55 ක බැරකම්වලට එළඹ තිබුණි.

**3.7 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | **ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ** | | |
| (i) | 2010 ජුලි 09 දිනැති අංක සීඒ/1/1/16/01 දරන චක්‍රලේඛය | - | විදේශ සංචාරයෙන් පසු දිවයිනට පැමිණ දින 07 ක් ඇතුළත ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) | 2007 පෙබරවාරි 28 දිනැති අංක සීඑස්ඒ/සී01/40 දරන චක්‍රලේඛය | 1,216,102 | වැඩමුළු 03 ක් පැවැත්වීම වෙනුවෙන් හෝටල් 03ක් සඳහා ගෙවීම් කර තිබුණි. |
| (ආ) | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| | 2015 ජුනි 26 දිනැති අංක 18/2015 දරන චක්‍රලේඛයේ 02 ඡේදය | 96,000 | එක් එක් සේවා වල සුවිශේෂීත්වය වෙනුවෙන් ගෙවනු ලබන වෘත්තීය දීමනාව හා ඉංජිනේරු දීමනාව යන දීමනා දෙකම ලබාගෙන තිබුණි. |
| (ඇ) | **රාජ්‍ය මුදල් චක්‍රලේඛ** | | |
| (i) | 2010 ඔක්තෝබර් 11 දිනැති අංක 01/2010/01 දරන චක්‍රලේඛයේ 5 ඡේදයේ (i) වගන්තිය | 62,475 | වැඩමුළු 03 ක් වෙනුවෙන් නිලධාරීන් තුන්දෙනෙකු සඳහා අනියම් දීමනාව ගෙවා තිබුණි. |
| (ii) | 2014 දෙසැම්බර් 30 දිනැති අංක 03/2014 දරන චක්‍රලේඛයේ 06 (viii) උපඡේදයේ | 50,999 | නිලධාරියෙකු සඳහා රජයේ වියදමින් ජංගම දුරකථනයක් මිලදීගෙන තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (iii) | 2015 මැයි 15 දිනැති අංක 01/2015/01 දරන චක්‍රලේඛයේ 3(අ) උප ඡේදය | 157,819 | විදේශ අධ්‍යයන, පුහුණු සාකච්ඡා, සම්මන්ත්‍රණ සඳහා සහභාගි වන නිලධාරීන්ට ගෙවනු ලබන අනියම් දීමනා, වැඩමුළු 02 ක් වෙනුවෙන් නිලධාරීන් දෙදෙනෙකු වෙත වැඩිපුර ගෙවා තිබුණි. |

(ඇ) **කළමනාකරණ සේවා චක්‍රලේඛ**

---------------------------------

| | | |
|---|---|---|
| 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන චක්‍රලේඛයේ 4.2.1 ඡේදය | 406,008 | ව්‍යාපෘති සඳහා කාර්ය මණ්ඩල පත් කිරීමේදී ආරම්භක වැටුප් පියවරේ නොතබා වැඩි වැටුප් ගෙවීම නිසා අධි ගෙවීම් සිදුකර තිබුණි. |

**3.8 විදේශාධාර ව්‍යාපෘති**

---------------------

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් විදේශ මුල්‍යාණය යටතේ ව්‍යාපෘති 20 ක් ක්‍රියාත්මක කර තිබුණි. ව්‍යාපෘති අනුව එහි ඇස්තමේන්තුගත පිරිවැයවල එකතුව රු. මිලියන 24,697.91 ක් වී තිබුණු අතර, ව්‍යාපෘති වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 17,986.37 ක් උපයෝජනය කර තිබුණි. එම විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ව්‍යාපෘති කාර්යසාධනය**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ජෛව විවිධාංගීකරණය සඳහා වූ සම්මුතිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ ජාතික ජෛව විවිධත්ව උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම සැකසීම සඳහා වූ ව්‍යාපෘතිය 2015 ජුලි 31 දින නිමකළ යුතුව තිබූ නමුත් 2016 ජුනි මාසය දක්වා ව්‍යාපෘති කාලය දීර්ඝ කර තිබුණි.

(ii) දිගුකල් පවත්නා කාබනික දූෂ්‍ය කාරක පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම යාවත්කාලීන කිරීමේ ව්‍යාපෘතිය 2015 ජුලි මාසය අවසන් වන විට නිම කිරිමට නියමිතව තිබුණි. 2015 දෙසැම්බර් මාසය දක්වා එය දීර්ඝ කර තිබූ නමුත් 2016 මැයි මාසය අවසන් වන විටත් යාවත්කාලීන කිරීමේ කටයුතු නිම කර නොතිබුණි.

(iii) වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලැසුම් ව්‍යාපෘතියෙහි කාලය 2015 වර්ෂයේදී අවසන් වී තිබුණද, ව්‍යාපෘතිය යටතේ ඉටුකළ යුතු ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 2,179 ක් වටිනා පහත සඳහන් ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට හෝ නොහැකිව අතිරේක මූල්‍යනය ව්‍යාපෘතියට පවරා තිබුණි.

- රන්දෙනිගල, රන්ටැඹේ, දඹුළුඔය සහ කණ්ඩලම වේලි ගේට්ටුවල තීන්ත ආලේපය මාරු කිරීම.
- දත්ත ලබා ගැනීම හා ප්‍රදර්ශනය කිරීම සඳහා වන පද්ධතියක් සකස් කිරීම(SCADA).
- වික්ටෝරියා වේල්ලේ හා පොල්ගොල්ල උමගේ ප්‍රතිකාර්මික වැඩ සිදුකිරීම.

- භූමිකම්පා නියාමනය හා පෙර අනතුරු ඇඟවීම් පද්ධතිය (Earthquake Monitoring and Early Warning System) සකස් කිරීම.

- සොරොව් කඳ පරීක්ෂා කිරීමේ උපකරණය (Sluice Barrel Inspection Instrument) මිලදී ගැනීම.

(iv) 2015 ජූනි වන විට ව්‍යාපෘති කාලය වර්ෂ දෙකකින් දීර්ඝ කර තිබුණද, ප්‍රතිකාරක වැඩ ඉටු කරන ලද වේලි 32 කින් වේලි 27 ක් මාස 2 ක සිට මාස 29 ක් දක්වා කාල පමාවකින් පසු අවසන් කර තිබුණි. මෙම කොන්ත්‍රාත් අවසන් කිරීමේදී පිරිවැය වෙනස්වීමේ ප්‍රතිශතය සියයට (22) ක සිට සියයට +44 දක්වා වෙනස්වී තිබීම දුර්වල කොන්ත්‍රාත් පරිපාලනයක් බව නිරීක්ෂණය විය. එසේම 2015 ජූනි 30 දින වන විට ඉදිරිපත් කර තිබුණු ව්‍යාපෘති කාර්යයසාධන වාර්තාව අනුව වේලි 15 ක වැඩ අවසන් කර සියලු ගෙවීම් අවසන් කර ඇති බව දක්වා තිබුණු නමුත්, එම වේලි සඳහා තවදුරටත් රඳවා ගැනීමේ මුදල් හා අවසාන ගෙවීම් සිදුකිරීමට තිබීම නිසා කාර්යසාධන වාර්තාවේ ඇතුළත් තොරතුරුවල විශ්වාසවන්තභාවය සැකසහිත විය.

(v) ව්‍යාපෘති මූල්‍ය ගිවිසුමේ 1(ඕ) කොටසේ උපලේඛන 1 අනුව සේනානායක සමුද්‍රය, සමනල වැව සහ වික්ටෝරියා වේල්ලෙහි පවත්නා ගැටළු පිළිබඳ විශේෂ අධ්‍යනයක් කර ප්‍රතිකාර්මික ක්‍රියාමාර්ග පිළිබඳ යෝජනා නිර්දේශ කිරීම සඳහා රු.මිලියන 52.47 ක ප්‍රතිපාදන සලසා තිබුණද, ව්‍යාපෘති ප්‍රගති වාර්තාවේ මෙම විශේෂ අධ්‍යනයන් සිදුකර නොතිබුණි.

(vi) මෙම ව්‍යාපෘතිය යටතේ වේලි ප්‍රතිකාර්මික වැඩ සඳහා උපදේශක සේවා සැපයීම වෙනුවෙන් රු.මිලියන 518.3 ක් වැයකර තිබුණද, වේලි 14 ක වැරදි ප්‍රතිකාර්මික වැඩ නිවැරදි කිරීම සඳහා රු.මිලියන 812.51 ක් වටිනා කොන්ත්‍රාත් නැවත ප්‍රදානය කර තිබීම නිසා උපදේශක කාර්යයන් සැපයීම නිසි පරිදි ඉටුකර තිබේද යන්න සැක සහිත විය.

(vii) ව්‍යාපෘතිය යටතේ ජල කාලගුණික විද්‍යා තොරතුරු පද්ධතිය ඉදිකිරීමට මිණුම් ගන්නා 122 ක් ස්ථාපිත කිරීම සඳහා රු.මිලියන 628.94 ක් වෙන්කර තිබුණු අතර රු.මිලියන 813.57 ක් වැයකර ස්ථාන 70 ක් පමණක් ස්ථාපිත කර තිබුණි. ඇස්තමේන්තු මුදලට වඩා රු.මිලියන 184.63 ක් වැයකර තිබුණු නමුත් ස්ථාන 52 ක වැඩ අවසන්කර නොතිබුණු නිසා එම කාර්යයන් අතිරේක මූල්‍ය ව්‍යාපෘතියට පවරා තිබුණි.

(viii) බහු - ආංශික ජල සම්පත් සැලසුම්කරණය යටතේ ජාතික ජල උපයෝජන සැලැස්ම, යාවත්කාලීන මහවැලි ජල සම්පත් සැලැස්ම හා මුන්දෙනිආරු ගංඟාදෝනි සැලැස්ම යන සැලැසුම් සකස් කර තිබුණි. මේ සඳහා සලසා තිබුණු රු.මිලියන 742.75 කින් රු.මිලියන 526.25 ක් වැයකර තිබුණු අතර එයින් රු.මිලියන 492.08 ක් සැලැසුම් සකස් කිරීමේ උපදේශක සේවාව ලබාගැනීම සඳහා වැය කර තිබුණි. මෙම සැලැසුම් පිළිගත් සැලැසුම් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපත්තිමය නිශ්කාෂනය ලබාගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2015 වර්ෂය අවසාන වීමට පෙර ලබාගත යුතු බව 2015 ඔක්තෝබර් 01 දින සිට 06 දින දක්වා පැවැත්වූ ලෝක බැංකු

රැස්වීමේදී තීරණය කර තිබුණද, 2015 දෙසැම්බර් 31 දින වන විටද එම අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ix) විදුලිබල මණ්ඩලයට අයත් කාසල්රි ජලාශයේ සිවිල් වැඩ හා විදුලි කාර්මික කටයුතු සඳහා රු.මිලියන 99.08 ක් වටිනා කොන්ත්‍රාත් 02 ක් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට බාරදී තිබුණද, 2013 වර්ෂයේදී අවසන් කළ යුතු මෙම කාර්යය 2015 දෙසැම්බර් 31 දින වන විට අවසන් කර නොතිබුණි. මේ යටතේ වේල්ලේ ජල ගැලීම් තත්ත්වයට මුහුණදීමට අවශ්‍යවන උපාංගයක් නිසි ආකාරයට සවිකිරීමට කොන්ත්‍රාත්කරු අපොහොසත් වීම නිසා විදුලි බල මණ්ඩලය හා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය එක්ව වෙනත් කොන්ත්‍රාත්තුවක් ලෙස අවසන් කිරීමට හා එහි පිරිවැය අතිරේක මූල්‍ය ව්‍යාපෘතියේ වියදම් යටතේ දැක්වීමටද තීරණයකර තිබුණි.

(x) ව්‍යාපෘති ණය ගිවිසුමේ 01(ජේ) ඡේදය අනුව ව්‍යාපෘතිය යටතේ සිදු කළයුතු වේලි ආරක්ෂණය සම්බන්ධයෙන් වූ කරුණු ඇතුළත් කර 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ පනත සංශෝධනය කරගැනීමට කටයුතු කළ යුතු වුවද, ව්‍යාපෘති කාලය වසර 07ක් ගත වී තිබුණද ඊට අදාළ කාර්යයන් කිසිවක් සිදුකර නොතිබුණි.

(xi) මෙම ව්‍යාපෘතියෙහි එක් කාර්යයක් වන වේලි ආරක්ෂණය හා කාර්යක්ෂමතා වර්ධනය යටතේ වේලි 80 ක ප්‍රතිකාර්මික හා මූලික ආරක්ෂණ පහසුකම් සකස්කිරීමේදී තෝරාගත් වේලි 15 ක් සඳහා හදිසි ක්‍රියාකාරී සැලැසුම් (Emergency action plan) 15 ක් සකස් කළ යුතු වුවද වේලි 08 ක පමණක් හදිසි ක්‍රියාකාරී සැලැසුම් සකස්කිරීමට උපදේශක සමාගමට පවරා තිබීම නිසා 2015 ජූනි 30 දින වන විට වේලි 08 ක පමණක් එම කටයුතු නිමකර තිබුණි.

(xii) වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලැසුම් අතිරේක මූල්‍ය ව්‍යාපෘතිය යටතේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් ප්‍රතිකාර්මික වැඩ හඳුනාගන්නා ලද වේලි 14 ක වැඩ සඳහා 2015 වර්ෂයට රු.මිලියන 80 ක ප්‍රතිපාදන සලසා තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට එයින් කිසිදු වේල්ලක වැඩ ආරම්භ කිරීම සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කර නොතිබුණි. එක් වේල්ලක් ප්‍රතිකාර්මික වැඩවලින් ඉවත් කර තිබුණි. එසේම මහවැලි අධිකාරියට අයත් ප්‍රතිකාර්මික වැඩ හඳුනාගන්නා ලද වේලි 10 ක් සඳහා රු.මිලියන 635 ක ප්‍රතිපාදන සලසා තිබුණද එයින් වේලි 02 ක ප්‍රතිකාර්මික වැඩ ඉවත් කර තිබුණු අතර, වේලි 04 ක ප්‍රතිකාර්මික වැඩ සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කර නොතිබුණි. විදුලිබල මණ්ඩලයට අයත් එක් වේල්ලක ප්‍රතිකාර්මික වැඩ සඳහා රු.මිලියන 05 ක ප්‍රතිපාදන සලසා තිබුණද, ඒ සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කර නොතිබුණි.

ව්‍යාපෘතියේ සංරචක අංක 03 යටතේ මූලික ව්‍යාපෘතිය මඟින් 2013 වර්ෂය වන විට රු.මිලියන 506.13 ක වියදම් කර තිබූ ජල භාවිත සැලැසුම් 03 ක් ක්‍රියාත්මක කිරීම සඳහා වන ප්‍රතිපත්තිමය තීරණයන් ලබාගැනීම සඳහා වන "කෙටුම්පත් අමාත්‍ය මණ්ඩල සංදේශය" රජයට ඉදිරිපත් කර අවසන් අනුමැතිය ලබාගෙන නොතිබීම නිසා එම සැලසුම් 03 ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය "මූලික ශක්‍යතා අධ්‍යයන" ආරම්භ කර ගැනීමට නොහැකිවී තිබුණි.

මෙම කාර්යය අතිරේක මූල්‍යනය ව්‍යාපෘතියට පවරා දී තිබූ නමුත්, අතිරේක මූල්‍යනය ව්‍යාපෘතිය 2014 සැප්තැම්බර් මාසයේ සිට ක්‍රියාත්මකව පැවතියද, 2016

අප්‍රේල් මාසය වන විට එම කාර්යය ඉටුවී නොතිබුණි. මේ නිසා මූලික ශක්‍යතා අධ්‍යයනය සඳහා 2015 වර්ෂයේදී සලසා තිබුණු රු.මිලියන 13 ක ප්‍රතිපාදනය උපයෝජනය කරගෙන නොතිබුණි.

**(ආ) විදේශාධාර ව්‍යාපෘතිවල ඇතුළත් සමහර කර්මාන්ත අතහැර දැමීම**

**(i) වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලැසුම් ව්‍යාපෘතිය**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- තිස්ස වැව, නාච්චදූව වැව, නුවර වැව යනාදියේ වේලි ප්‍රතිකාර්මික වැඩ ආරම්භකිරීම සඳහා 2011 වර්ෂයේදී රු.මිලියන 475.7 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, 2015 ජූනි 30 දින වන විට ඉන් රු.මිලියන 278.19 ක් වැයකර තිබුණි. කොන්ත්‍රාත්කරුවන් නියමිත දිනට වැඩ අවසන්කර නොතිබීම හා අනුමැතියෙන් තොරව උප කොන්ත්‍රාත් ලබාදීම හේතුවෙන් 2015 වර්ෂයේදී කොන්ත්‍රාත් කාර්යයන් අතරමඟ නවතා තිබුණි. පසුව කොන්ත්රාත්වල ඉතිරිවැඩ ඉටුකිරීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවට පවරා තිබුණි.

- ව්‍යාපෘති ණය ගිවිසුමේ 01(එන්) ඡේදය අනුව ව්‍යාපෘතිය විසින් පොල්ගොල්ල උමඟ හා ලක්ෂපාන නව උමඟ සඳහා ප්‍රතිකාර්මික කාර්යයන් හඳුනාගැනීමට පර්යේෂණයක් සිදුකිරීමට පියවර ගතයුතු බව සඳහන් කර තිබුණු අතර, පොල්ගොල්ල උමඟෙහි ප්‍රතිකාර්මික ක්‍රියාමාර්ග ගැනීම සඳහා අවශ්‍ය පර්යේෂණ 2015 දෙසැම්බර් 31 දින වනවිටත් ආරම්භ කර නොතිබුණි. ජාත්‍යාන්තර ප්‍රමිත අවශ්‍යතාවන්ට අනුව උමඟ පරීක්ෂාව වසර 20 ක සිට වසර 30 ක අතර කාල පරාසයක් තුළ කළ යුතු නමුත්, වසර 28 ක් ගතවී තිබුණද, පොල්ගොල්ල උමඟෙහි පරීක්ෂණ කටයුතු සිදුකිරීමට පියවර ගෙන නොතිබුණි. තවද, 2013, 2014 හා 2015 වර්ෂවලදී පැවති ලෝක බැංකු ව්‍යාපෘති සමාලෝචන කමිටුවලදී මෙම කරුණු දිගින් දිගටම සාකච්ඡා කර තිබුණි. 2014 ජූලි 22 දින හා ජූලි 23 දිනවල පැවති සමාලෝචන කමිටු රැස්වීමට අනුව මෙම පොල්ගොල්ල උමඟ පර්යේෂණ කටයුතු සඳහා වසා දැමුවහොත් නියං කාලගුණික තත්ත්වය යටතේ මහජනතාවට අමතර අපහසුතා සිදුවන බැවින්, මෙම කටයුත්ත සිදු නොකරන ලෙස වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය උපදෙස් දී තිබුණු බව දක්වා තිබුණි.

2015 ඔක්තෝබර් 01 දින සිට 07 දින දක්වා පැවැත්වූ ලෝක බැංකු ව්‍යාපෘති සමාලෝචන කමිටුවේදී මෙම උමඟ සම්බන්ධයෙන් නැවත සාකච්ඡා නොකරන්නට තීරණය කර තිබුණි. 2014 වර්ෂයේ නියං කාලගුණික තත්ත්වය යටතේ මෙම කාර්යය අත්හැර තිබුණද, ව්‍යාපෘතිය ආරම්භ කළ දින සිට 2015 දෙසැම්බර් 31 දින දක්වාම මෙම කාර්යය ඉටුකිරීමට ඉදිරි සැලැස්මක් හෝ සකස් කර නොතිබුණි. උමඟ වසා දැමීම නිසා සිදුවන අපහසුතාවයට වඩා මෙම ප්‍රතිකාර්මික වැඩ ඉටු නොකිරීම නිසා සිදුවන අලාභ හානිය අතිවිශාල බව විගණනයේදී අනාවරණය වීය.

**(ii) වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් අතිරේක මූල්‍ය ව්‍යාපෘතිය**

-----------------------------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලැසුම් අමතර මූල්‍යනය ව්‍යාපෘතියට ප්‍රතිපාදන ලබාගැනීම සඳහා සැකසූ පිරිවැය පත්‍රය අනුව "පොල්ගොල්ල උමඟෙහි ප්‍රතිකාර්මික වැඩ හඳුනාගැනීම සඳහා වන පර්යේෂණ කටයුතු අතිරේක මූල්‍යනය ව්‍යාපෘතිය මඟින් ඉටුකිරීමට ප්‍රතිපාදන ඉල්ලා තිබුණි. නමුත් මූලික ව්‍යාපෘතිය මඟින්ද ආරම්භ කිරීමට නොහැකිවී තිබූ මෙම කාර්යය 2016 වර්ෂය වන විට සම්පූර්ණයෙන්ම අතිරේක මූල්‍යනය ව්‍යාපෘතිය මගින්ද අතහැර තිබුණි. ජාත්‍යන්තර ප්‍රමිති අවශ්‍යතාවයන්ට අනුව උමඟ පරීක්ෂණය වසර 20 ක සිට වසර 30 ක් අතර සිදු කළ යුතු නමුත්, වසර 28 ගතවී තිබුණත්, අදාළ පරීක්ෂණ කටයුතු සිදුකිරීමට පියවර ගෙන නොතිබුණි. නියං කාලගුණික තත්ත්වයන්හිදී මෙම උමඟ වසා දැමීම නිසා ජනතාවට අමතර අපහසුතා ඇතිවන බැවින්, මෙම කාර්යය 2014 වර්ෂයේදී අතහැර දමා තිබුණද, ඉන්පසු 2016 අප්‍රේල් මාසය වන විටත් අදාල කටයුත්ත ඉටුකිරීම පිළිබඳ ව්‍යාපෘතිය සැලකිල්ලක් දක්වා නොතිබුණි.

  මෙම උමඟ ප්‍රතිසංස්කරණය සඳහා වන විකල්ප යෝජනා සලකා බලා ව්‍යාපෘති කාලසීමාව තුළදී උමඟෙහි ප්‍රතිකාර්මික වැඩ ආරම්භ කිරීමට අදාළ වන සැලැසුම් සකස් කර ඉදිරි පියවරයන්වලට එළඹීමට නොහැකිවීම ව්‍යාපෘතිය මඟින් ඉටු කළයුතු අත්‍යාවශ්‍ය කටයුතු මඟහැර දැමීමක් ලෙස විගණනයේදී නිරීක්ෂණය විය.

- ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබුණු කාර්යසාධන වාර්තාවට අනුව වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලැසුම් ව්‍යාපෘතියේ සංරචක අංක 01 යටතේ ආරම්භ කිරීමට නොහැකිව මෙම ව්‍යාපෘතියට පවරා දුන් දත්ත ලබාගැනීම හා ප්‍රදර්ශනය කිරීමේ ක්‍රමවේදය සකස්කිරීම (SCADA) හා නායයෑම් සමාලෝචනය හා පෙර අනතුරු ඇඟවීමේ ක්‍රමවේදය සකස්කිරීම යන කාර්යයන් දෙකක් සඳහා රු.මිලියන 80 ක ප්‍රතිපාදන සලසා තිබුණද, එම කටයුතු අතිරේක මූල්‍යනය ව්‍යාපෘතිය මඟින්ද අතහැර තිබුණි.

**(ඇ) ව්‍යාපෘති සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**

-----------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘති 05 ක් සඳහා විදේශ මූල්‍යනය යටතේ සලසා තිබුණු රු.මිලියන 1,046.95 ක ප්‍රතිපාදනවලින් කිසිදු උපයෝජනය ක් සිදු කර නොතිබුණි.

**3.9 කාර්යසාධනය**

----------------

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම් (අරමුණින් බැහැරවීම් යනාදිය)**

-----------------------------------------------------------------------

අමාත්‍යාංශය සිය අරමුණුවලට අදාල කාර්යවලින් බැහැරව ක්‍රියා කළ අවස්ථා නිරීක්ෂණය වූ අතර, නියැදි පරීක්ෂණවලදී එසේ අනාවරණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) 2015 ජනවාරි 01 දින සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා වූ කාල සීමාව සඳහා කාලගුණ විපර්යාස පිළිබඳ උපක්‍රම වැඩිදියුණු කිරීම සඳහා රජය හා පෞද්ගලික අංශය විසින් භාවිතා කළ යුතු තාක්ෂණික ප්‍රවේශයන් සැකසීම අරමුණු කොටගෙන ඕසෝන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතු වුවත්, එම අරමුණු ඉටුකර ගැනීම සඳහා වූ ක්‍රියාකාරකම් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ii) ඕසෝන් ව්‍යාපෘතිය මගින් ගොඩ කිරීමේ මධ්‍යස්ථාන (reclamation Centers) ඇති කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම අනුව ස්ථාන 07 ක් පමණක් නම් කර තිබියදී සැලැස්මට පටහැනිව පොලොන්නරුවේ කාර්මික විද්‍යාලයක් පිහිටුවා තිබුණි.

**(ආ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

-----------------------------------------------------

අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටුනොකර තිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) ඕසෝන් ව්‍යාපෘතියේ එක්සත් ජාතීන්ගේ වාර්ෂික වැඩ සැලැස්මේ වැය විෂය වර්ගීකරණ අංක 721600 යටතේ ගිවිසුම්ගත සේවා සපයන ආයතන ලෙස ක්ෂේත්‍ර 15 ක් නිර්වචනය කර තිබූ නමුත් ක්ෂේත්‍ර 03 ක් පමණක් ආවරණය වන පරිදි වැඩමුළු සහ මෙහෙයුම් වැඩසටහන් පැවැත්වීමට සැලැසුම් කර තිබුණි.

(ii) 1998 වර්ෂයේදී පරිසර අමාත්‍යාංශය විසින් ආරම්භ කරන ලද පවිත්‍රගංගා වැඩසටහන යටතේ අවිස්සාවේල්ලේ සිට මෝදර දක්වා වූ කැළණි ගංගා ප්‍රදේශයේ දූෂණය අවම කර ජලයේ තත්ත්වය හිතකර මට්ටමක පවත්වා ගැනීම අරමුණ වී තිබුණි. මේ සඳහා වූ ප්‍රතිපත්ති හා උපායමාර්ග පිළියෙල කිරීමට සැලැසුම්කර තිබූ නමුත් මේ දක්වා එම කටයුතු සිදුවී නොතිබුණි.

(iii) 2016 වසර සඳහා පවිත්‍ර ගංගා වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරීමට ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කරන ලෙස පළාත් පාලන ආයතන 13 ක් සඳහා දැනුම්දී තිබූ නමුත් එක් පළාත් පාලන ආයතනයක් පමණක් ප්‍රතිචාර දක්වා තිබුණි.

(iv) තිරසර ගම්මාන වැඩසටහන 2015 යටතේ තිරසර ගම්මාන 07 ක් ඉදිකිරීමට ක්‍රියාකාරී සැලැස්ම මගින් සැලැසුම්කර ඇති නමුත් ගම්මාන 02 ක පමණක් ක්ෂේත්‍ර අධ්‍යයන සිදුකර තිබුණි.

**(ඇ) සැලැසුම් කිරීම**

-----------------

**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා නොකිරීම**

-----------------------------------------------------

2014 පෙබරවාරි 14 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව පහත සඳහන් අවස්ථාවලදී කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(i) ජාතික දැව ප්‍රතිපත්තිය සකස් කිරීමට සැලැසුම්කර තිබූ නමුත් එය සකස් කර නොතිබුණි.

(ii) දිවයිනේ ජෛව විවිධත්වය මිලයනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ සැලැසුම් කර තිබූ දත්ත රැස්කිරීමේ කටයුතු සහ වෙබ් අඩවි වැඩිදියුණු කිරීමට අදාළ කාර්යයන් ඉටුකර නොතිබුණි.

**3.10 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

අමාත්‍යාංශය විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(i) මොන්ට්‍රියල් සංධානය ක්‍රියාත්මක කිරීම (ඕසෝන් ව්‍යාපෘතිය) ව්‍යාපෘතියේ වාර්ෂික වැඩ සැලැස්ම අනුව ගිවිසුම්ගත සේවා, පුද්ගලික කාර්ය මණ්ඩල ගෙවීම් හා දේශීය උපදේශන සේවා වශයෙන් ගිණුම් දෙකක් වෙන්කර තිබුණි. නමුත් ව්‍යාපෘතිය භාර අධ්‍යක්ෂවරයාට හා ගණකාධිකාරීවරයාට 2015 ඔක්තෝබර් මාසය දක්වා දීමනා වශයෙන් රු.419,985 ක් ගෙවා තිබුණත්, එම ගෙවීම දේශීය උපදේශන සේවා යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ii) 2014 දෙසැම්බර් 31 දිනෙන් පසුව අමාත්‍යාංශය සතු වාහනයක් කි.මී.9,626 ක් ධාවනය කර තිබු අතර ඒ සඳහා දෛනික ධාවන සටහන් විගණනට ඉදිරිපත් කර නොතිබුණු අතර ඉන්ධන ලේඛනය අනුව ඉන්ධන නිකුත් කිරීමෙන් තොරව වාහනයක් කි.මී. 8,327 ක් ධාවනය කර තිබුණි.

(iii) තනතුරු මාරුවීමෙන් පසු වුවද, ඉංජිනේරු කාර්යාංශයේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා ගෙවනු ලබන දිරිදීමනාව නිලධාරියෙකු වෙත මාස 07 කට රු.424,576 ක් ගෙවා තිබුණි.

(iv) තනතුරට හිමි වැටුප් පරිමාණයේ අදාළ වැටුප් පියවරෙහි නොතබා නිලධාරියෙකු වෙත මාස 07 ක් වෙනුවෙන් රු.688,877 ක වැටුප් ගෙවා තිබුණි.

**3.11 අවිධිමත් ගනුදෙනු**

**රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

අමාත්‍යාංශය විසින් සිදු කර තිබුණු ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 මාර්ගෝපදේශය ප්‍රකාරව තරගකාරී මිල කැඳවීමකින් තොරව හරිත ලංකා වැඩසටහන සහ පිරිසිදු වායු තත්ත්ව ක්‍රියාකාරී සැලැස්ම යාවත්කාලීන කිරීම සඳහා වූ තෙදින වැඩමුළුව පැවැත්වීමට රු.795,594 ක් වැය කර පෞද්ගලික ආයතනයක් තෝරාගෙන තිබුණි.

(ආ) උක්ත වැඩමුළුව පැවැත්වීමේ ඇස්තමේන්තුව රු.980,000 ක් වුවත් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14 මාර්ගෝපදේශය ප්‍රකාර අධිකාරී සීමාවලට යටත්ව ප්‍රසම්පාදන කමිටුවක් පත්කර නොතිබුණි.

**3.12 අනාර්ථික ගනුදෙනු**

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) අමාත්‍යාංශය සතුව ප්‍රමාණවත් වාහන තිබියදී පරිසර සංරක්ෂණය පිළිබඳ තුන් අවුරුදු

සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ වැඩමුළුවට සහභාගි වීම සඳහා අධි සුඛෝපභෝගී බස් රථයක් රු.40,100 ක කුලියක් ගෙවා ලබාගෙන තිබුණි.

(ආ) හරිත ලංකා වැඩසටහන සහ පිරිසිදු වායු තත්ත්ව ක්‍රියාකාරි සැලැස්ම යාවත්කාලීන කිරීම සඳහා වූ තෙදින වැඩමුළුව වෙනුවෙන් නවාතැන්, කෑම සහ දේශන ශාලා ගාස්තු සඳහා රු.72,450 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) අමාත්‍යාංශය සතුව ප්‍රමාණවත් වාහන තිබියදී ඕසෝන් දින අමාත්‍යාංශයේ නිලධාරීන් ප්‍රවාහනය සඳහා රු.4,020 ක් ගෙවා කුලී පදනම මත වාහනයක් ලබාගෙන තිබුණි.

(ඈ) 2015 අප්‍රේල් 20 දින සිට 24 දින දක්වා ඕසෝන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාළ වැඩ මුළු 02 ක් පවත්වා තිබූ අතර මේ සඳහා ශ්‍රී ලංකා රජයේ එක් නියෝජිතයෙකු වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් වියදම් කරන බව දක්වා තිබියදී, ශ්‍රී ලංකා ජනරජය නියෝජනය කරන අවම සහභාගීත්වය ඉක්මවා අතිරේක නිලධාරියෙකු සහභාගි කරවීම නිසා අනියම් හා සංයුක්ත දීමනා වශයෙන් රු.961,891 ක් ගෙවා තිබුණි.

(ඉ) අමාත්‍යාංශය සතු වාහනයක් රු.421,139 ක් ගෙවා අළුත්වැඩියා කර මාස 06 ක් ගතවීමටත් පෙර නැවත රු.230,819 ක අළුත්වැඩියාවක් කර තිබුණි. දෙවන වර අළුත්වැඩියා කිරීම සඳහා වාහනය අවුරුදු 01 මාස 08 ක කාලයක් ගරාජය තුළ රඳවාගෙන තිබුණි. මේ සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. දෙවන වර අළුත්වැඩියාවෙන් පසුව වාහනය ධාවනය සඳහා යොදා ගෙන නොතිබුණි. ඒ අනුව අමාත්‍යාංශය විසින් වැය කරන ලද රු.651,958 ක වියදම නිෂ්ඵල වී තිබුණි.

## 3.13 විසඳා නොතිබුණු විගණන ඡේද

අමාත්‍යාංශයට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| **වර්ෂය** | **ඡේද අංකය** | |
| 2014 | 3.5 | කාර්යාල උපකරණ හා වෙනත් අයිතම 71 ක් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවතුණි. |
| 2014 | 3.9 | 2010 වර්ෂයට පෙර පැවත එන රු.588,278 ක් වූ පාඩු හා අලාභ හානි 02 ක් පැවතුණි. |
| 2014 | 3.11 | පුරප්පාඩු 112 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි. |

## 3.14 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 54 | 24 | 30 |
| (ii) | තෘතියික මට්ටම | 34 | 34 | - |
| (iii) | ද්විතියික මට්ටම | 173 | 113 | 60 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 76 | 54 | 22 |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 01 | 01 | - |
| | **එකතුව** | **338** | **226** | **112** |